නිපුණතාව 14.0 - කළමනාකරණ ගිණුම්කරණයේ මූලික සංකල්ප ඇගයීමට ලක් කරයි.
නිපුණතා මට්ටම 14.4 - ශ්‍රම කාලය සම්බන්ධයෙන් වාර්තා තබයි.

**<u>ශ්‍රම පිරිවැය</u>** - භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවීමේ නියුතු ශ්‍රමිකයන් විසින් කැප කරන කායික හෝ මානසික ශ්‍රමය වෙනුවෙන් සෘජුව හෝ වක්‍රව දරනු ලබන වියදම් ශ්‍රම පිරිවැය වේ.
උදා - ඇඟලුම් නිෂ්පාදන ආයතනයක ඇඟලුම් මසන ශ්‍රමිකයින් සඳහා ගෙවන වැටුප් සෘජු ශ්‍රම පිරිවැය වන අතර එම ආයතනයේ සුපරීක්ෂකවරුන් සඳහා ගෙවන වැටුප් වක්‍ර ශ්‍රම පිරිවැය වේ.

**<u>ශ්‍රම පිරිවැයට ඇතුළත් වන දෑ</u>**

- සේවකයන්ගේ මූලික වැටුප
- අතිකාල දීමනා
- වෙනත් අතිරේක දීමනා
- වෛද්‍ය හෝ වෙනත් විශේෂිත දීමනා
- අර්ථසාධක අරමුදලට දායකවීම
- සේවා නියුක්ති භාර අරමුදලට දායකවීම

**<u>ශ්‍රම පිරිවැය පාලනයේ වැදගත්කම</u>**

භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී දරනු ලබන අනෙකුත් පිරිවැය වර්ගයන්ටත් වඩා වැඩියෙන්ම ශ්‍රම පිරිවැය පාලනය වැදගත් වේ.

- ශ්‍රමය මානව සම්පතක් බැවින් වෙනත් අජීව සම්පත් පාලනයට වඩා වැඩි අවධානයක් යොමු කළ යුතු වීම.
- පිරිවැය ඒකකයක වටිනාකමින් වැඩි දායකත්වයක් ශ්‍රම පිරිවැයෙන් නියෝජනය වන නිසා ශ්‍රම පිරිවැය පාලනයකින් යුතුව පවත්වා ගෙන යාම වැදගත් වීම.
- ශ්‍රමයේ ඵලදායීත්වය ඉහළ දැමීම තුළින් නිෂ්පාදනය වැඩි වීම මත ඒකකයක පිරිවැය අවම කර ගැනීමට හැකිවීම.

**<u>අභ්‍යාස</u>**

1.ශ්‍රම පිරිවැයට ඇතුළත් වන අයිතම සඳහන් කරන්න.
2.ශ්‍රම පිරිවැය පාලනයෙන් ව්‍යාපාරයකට අත්වන වාසි කවරේද?